# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2016

# Primary Piriven Mid Year Term Test - 2016

4 වසර / Grade 4

**සිංහල I** — **කාලය : පැය තුනයි**

**Sinhala I** — **Time : Three hours**

* ***I* කොටසේ ප්‍රශ්න දෙකට ද *II* කොටසින් එක් ප්‍රශ්නයකට ද *III* කොටසින් ප්‍රශ්න දෙකකට ද වශයෙන් තෝරා ගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

## *I* - කොටස

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 250කට නො අඩු රචනයක් ලියන්න.

i. නිරෝගී බව උතුම්ම ලාභය යි.  ii. විනයගරුක සමාජයක් ගොඩනගමු

iii. වස විස නැති ගොවිතැන  iv කියවීම මිනිසා සම්පූර්ණ කරයි.

v. සමගි බලේ ජය ගෙනදේ

(ලකුණු - 25)

02. පහත සඳහන් ගද්‍ය පද්‍යවල අදහස් ලිහිල් බසින් ලියන්න.

අ) උපසම්පදාව පිණිස දේසේ යන ගමනක් සම්භ ව මුදු යාත්‍රාවක් කරන විටක සාමණේර බිලියක් දුන්නොත් මිස යන්ට නො දෙමි කියා යක්ෂ රාක්ෂයෙක් කීයේ වී නම් එවිට මා ම බිලි කොට දී සෙසු හැම තැන්ම සුවසේ සසුන් පවත්නා දේසේකට ගොස් උපසම්පදාව ලබමින් නැවත ලංකාවට ම අවුත් අප මහ රාජෝත්තමයාණන් වහන්සේට ඒ පින්පෙත් දෙමින් පසුබට බුදුසසුන් වර්ධනය කිරීම කරන සේ යෙදෙව් යනාදීන් සත්‍ය ක්‍රියා වශයෙන් අභිනව ජීවිත පරිත්‍යාග ගාථා ප්‍රබන්ධ කොට සන්න කිරීමෙන් ලියා ත් තැබූ සේක.

(ලකුණු - 15)

ආ)

කියනු කිම  මහිමා
එයැඳුරු ගඳඹ  උතුමා
අව පන්සිළු  තමා
තමා අතවැසි කරනු  නියමා
  අවරඟනන්  රුවට
  මා හැඟි අමා  රසයට
  එයැඳුරු වෙණ  නදට
  මෙලොව කවරෙක් නොවන්නෙද  තුට
නැත රිවි රැස්  පහස
නොපිපෙන තඹුරු වන  ලෙස
ඹහු වෙණ නදින්  මිස
අනික් නදකින් අපි නොවෙමු  තොස

(ලකුණු - 15)

## *II* - කොටස

03. අ) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

i. ඖෂධ / ඓරාවණ / විමර්ශනය  ii. පුස්ථකාලය / නිස්ශබ්ද / දුශ්චරිත

iii. යථාර්තය / මොනරා / විනිෂ්චය  iv. මර්ධනය / දුක්ඛිත / දුශ්කර

(ලකුණු - 05)

ආ) පහත සඳහන් සන්ධි පද විසන්ධි කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| i. | කොලුවා | ii. | අම්පාර | iii. | නිරවුල් |
| iv. | කඳුරැළි | v. | ඇද්දළ | | |

(ලකුණු - 05)

ඇ) පහත සඳහන් සමාස පද යොදා අර්ථවත් වාක්‍ය 05ක් නිර්මාණය කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| i. | පබල | ii. | සතුරුබිය | iii. | දුදන |
| iv. | ශිෂ්‍යාධාර | v. | පොත්පත් | | |

(ලකුණු - 05)

04. අ) පහත සඳහන් කර්මකාරක වාක්‍ය කර්තෘකාරක වාක්‍ය බවට හරවා ලියන්න.

i. මා විසින් පොත බැලෙයි.

ii. ගුරුවරුන් විසින් අවවාද දෙනු ලබයි.

iii. ගුරුවරුන් විසින් සිසුහු තැනෙති.

iv. පියා විසින් මම සැනසෙමි

v. මව විසින් දරුවෝ නැළවෙති

(ලකුණු - 05)

ආ) පහත සඳහන් කෘදන්ත පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| i. | ලියන | ii. | කැපුණු | iii. | බැලීම් |
| iv. | නටන | v. | නටනු | | |

(ලකුණු - 05)

ඇ) පහත දැක්වෙන ඡේදයේ පද නිවැරදි ලෙස වෙන් කොට නැවත ලියන්නී

"එක් ස්ත්‍රියක් පුතකුවඩා ගෙන පණ්ඩිතයන් වහන්සේ පොකුණටගොස් ආදිකොට පුතුනාවා තමාගේකඩ මත්තේහිඳුවා, තොමෝ ඉස් සෝදා නහන්නට බට, ඇනාන්නට බටඇසිල්ලෙහි යකිනියක්ඇගේ පුතුදැක කනු කැමැතිවගැහැණු වෙසක්ගෙන දරුවන් සමීපයට අවුත්......."

(ලකුණු - 05)

The National e-learning Portal for The General Education

05. අ) පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්නී

| | | | |
|---|---|---|---|
| i. | උපාසකයා සිල් සමාදන් වූවාය. | ii. | ඔවුහු පාසල් ගියෙහු. |
| iii. | තුරුපෙළ සුළඟට පෙරලෙති. | iv. | මැණියන්දැ පෙහෙවස් සමාදන් වූවාය. |
| v. | කෙනෙක් ධර්මය අසයි. | vi. | පාසලේ ළමුන් ඇත. |
| vii. | සිසුහු පාසලට පැමිණ ඇත. | viii. | අපි දෙමාපියන්ට සැලකීම මැනවි. |
| ix. | නාහිමියෝ ධර්මය දෙසයි | x. | අපි විහාරස්ථානය පිරිසිදු කළෝය. |

(ලකුණු - 10)

ආ) පහත සඳහන් අර්ථ ප්‍රකාශ කිරීම සඳහා තද්ධිත නාම දක්වන්න.

| | | | |
|---|---|---|---|
| I. | ධනය බොහෝ ඇති | ii. | ගමෙහි වාසය කරන |
| iii. | විදේශයට අයත් | iv. | බලය ඇති |
| v. | ඉස් පෙදෙස | | |

(ලකුණු - 05)

The National e-learning Portal for The General Education

## III - කොටස

06. ගුත්තිල කාව්‍ය තුළ රමණීය වර්ණනා ඇතුළත් වේ. ඔබ ඉගෙනගත් වැනුමක් මගින් සනාථ කරන්න.

(ලකුණු - 15)

07. යහපත් මිතුරුදමක් පිළිබඳ ආදර්ශ විජයබාකොල්ලය නවකතාවෙන් ලබා දේ. මෙතෙක් උගත් පරිච්ඡේදය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු - 15)

08. නියම භික්ෂුවකගේ කාර්යභාරය පිළිබඳව දැනුවත් කිරීමක් සංඝරාජ සාධුචරිතයෙන් ලබාදේ. එය කොතෙක් දුරට සත්‍ය දැයි උගත් පාඩම් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු - 15)